# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2022 (2023)

## 57 - නාට්‍ය හා රංගකලාව

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

### ලකුණු දීමේ පටිපාටිය

### I පත්‍රයේ අභිමතාර්ථ

පෙරදිග රටවල නාට්‍ය හා රංගකලාව පිළිබඳ මූලධර්ම හා නිර්දිෂ්ට නාට්‍ය පෙළ පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.
මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්තය.

**I පත්‍රය ලකුණු බෙදීයාම**

**I කොටස -** බහුවරණ ප්‍රශ්න 40කි. නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුරට එක් ලකුණ බැගින් පිළිතුරු 40ට මුළු ලකුණු සංඛ්‍යාව 40 කි.

**II කොටස -** A හා B යනුවෙන් කොටස් දෙකකි. A හා B යන කොටස් දෙකෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න 04කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

A හා B යන කොටස් දෙකෙහි ඇති සෑම ප්‍රශ්නයක්ම ව්‍යූහගත ආකාරයට සකස් කොට ඇත.

- එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 15 කි.
- පිළිතුරු සඳහා හිමිවන මුළු ලකුණු 15 x 4 = 60

I කොටස හා II කොටසේ A හා B යන කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් II පත්‍රය සඳහා මුළු ලකුණු 40 + 60 = 100 කි.

## ලකුණු දීමේ පටිපාටිය
## II පත්‍රයේ අභිමතාර්ථ

අපරදිග රටවල නාට්‍ය කලාව පිළිබඳ මූලධර්ම හා නිර්දිෂ්ට නාට්‍ය පෙළ පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.

මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.

**II පත්‍රය ලකුණු බෙදීයාම**

I කොටස - බහුවරණ ප්‍රශ්න 40 කි. වඩාත් නිවැරදි පිළිතුරට එක් ලකුණ බැගින් මුළු ලකුණු 40 කි.

II කොටස - A හා B යනුවෙන් කොටස් දෙකකි. එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය. සෑම ප්‍රශ්නයක් ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත.

- එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 15 කි.
- පිළිතුරු සඳහා හිමිවන මුළු ලකුණු $15 \times 4 = 60$

I කොටස හා II කොටසේ A හා B යන කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් II පත්‍රය සඳහා මුළු ලකුණු $40 + 60 = 100$ කි.

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

**නාට්‍ය හා රංග කලාව - සිංහල I**
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

**57 S I**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ......................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

* නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

1. "නාට්‍යය යනු ලෝකයාගේ පැවැත්ම අනුකරණය කිරීමකි." මෙය කවරකු ගේ නිර්වචනයක් ද?
   (1) භරතමුනි (2) ධනංජය (3) අභිනවගුප්ත
   (4) භට්ටලෝල්ලට (5) භට්ටනාරායණ (.........)

2. 'නෘත්‍ය' යන්නට වඩාත් ගැළපෙන වරණය තෝරන්න.
   (1) නෘත්‍යයෙහි ඇත්තේ අර්ථ විරහිත රිද්මයකි.
   (2) නෘත්‍ය යනු රිද්මයානුකූල අංග චලනය යි.
   (3) උඩරට නර්තනයෙහි නෘත්‍ය බහුල වශයෙන් අන්තර්ගත ය.
   (4) නෘත්‍ය යනු නෘත්ත යන්නට පර්යාය පදයකි.
   (5) ආංගික සහ සාත්ත්වික අභිනය මගින් කිසියම් භාවයක් ප්‍රකට වන නර්තනයකි. (.........)

3. සාත්ත්වික අභිනය පමණක් අඩංගු වරණය තෝරන්න.
   (1) අශ්‍රු, ප්‍රලය, ස්තම්භ, ස්වරභංග, වේපථු
   (2) හස්ත, අපවාරිත, වේපථු, රෝමාංච, ජඩතා
   (3) වෛවර්ණ්‍ය, ප්‍රලය, ස්වේද රෝමාංච, ග්ලානි
   (4) වේපථු, චාරී, ගද්ගද, ප්‍රලය, ස්වේද
   (5) ප්‍රලය, චාරී, ග්ලානි, ජඩතා, අපවාරිත (.........)

4. ආහාර්ය අභිනය පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.
   (1) අංග රචනය ආහාර්ය අභිනයට අයත් නො වේ.
   (2) ආහාර්ය අභිනය වැදගත් වන්නේ නාට්‍යධර්මී ශෛලියේ දී ය.
   (3) ආහාර්ය අභිනය නළු නිළියන් හඳුනාගැනීමට උපකාරී වේ.
   (4) නාට්‍යයේ ශෛලිය ආහාර්ය අභිනයට අදාළ නො වේ.
   (5) චතුර් අභිනයෙන් අවම වශයෙන් වැදගත් වන්නේ ආහාර්ය අභිනය යි. (.........)

5. 'ආලවක දමනය' නම් බෞද්ධ පූජා කර්මයෙහි අන්තර්ගත චරිතය කුමක් ද?
   (1) දේව දූතයා (2) ගද්‍රභ (3) මිලිඳු රජු
   (4) දේශනාවාදීහු (5) බහුබූතයා (.........)

6. කොහොඹා කංකාරියේ එන උෟරා යක්කමේ උෟරෙකුගේ වේශයක් ගෙන සිටින්නේ කවරෙක් ද?
   (1) මලය රජ (2) රාහු අසුරේන්ද්‍රයා (3) සඳහිරු
   (4) විජය රජ (5) කින්සිරු (.........)

[ඉදිරිපිට බලන්න]

7. සැන්දෑ පිදේනිය හා උඩුවියන් පාලිය අන්තර්ගත වන්නේ කවර ශාන්තිකර්මයේ ද?
(1) රට යකුම (2) සන්නියකුම (3) සූනියම් යාගය
(4) මංගර මඩුව (5) කොහොඹා කංකාරිය (.........)

8. කෝලම් නාටකවල මරු රාක්ෂසයා ගේ වර්ණනාවට සමාන කවි ඇති ශාන්ති කර්මය කුමක් ද?
(1) රට යකුම (2) සූනියම් යාගය (3) සන්නි යකුම
(4) ගම්මඩුව (5) දෙවොල් මඩුව (.........)

9. කාරිය කරවන රාළ ගායනා කරන පහත සඳහන් කවියෙන් පසු සබයට එන්නේ කුමන කෝලම් චරිතය ද?
"පණිවිඩ කරවනා - ලෙසට සබයට එමිනා
බස්තමක් රැගෙනා - එන්ට සැරසී සබයෙ සිටිනා"
(1) හේවායා (2) ආරච්චි (3) පොලිස් (4) මුදලි (5) අඩබෙර (.........)

10. ශ්‍රී ලාංකේය වේදිකා නාට්‍ය ඉතිහාසයේ ප්‍රථම වතාවට රංගනය සඳහා ස්ත්‍රීන් සහභාගී වූ නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) කවි නාඩගම (5) නූර්ති (.........)

11. නාඩගමෙහි අනාගතවක්තෘ ලෙසින් නම් කරනු ලබන්නේ,
(1) බහුබූත කෝලමා ය. (2) දේශනාවාදීහු ය. (3) සෙල්ලන් ළමා ය.
(4) පොතේ ගුරු ය. (5) ගුරුන්නාන්සේ ය. (.........)

12. පණ්ඩුකාභය සහ දුටුගැමුණු නූර්ති නිර්මාණය කළ රචකයා කවුද?
(1) ජෝන් ද සිල්වා (2) සී දොන් බස්තියන් (3) චාල්ස් ඩයස්
(4) මැන්දිස් පෙරේරා (5) ඩී. එල්. ස්ටීවන් සිල්වා (.........)

13. මිනර්වා නාට්‍ය පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.
(1) මිනර්වා නාට්‍ය නිර්මාණවලට ජාතක කතා පදනම් විය.
(2) නාඩගම් තනු නිර්මාණය හා සමාන නාට්‍ය ගීත මිනර්වා නාට්‍යවලට අඩංගු විය.
(3) මධ්‍යම පාන්තික ජීවන රටාව විවරණය වන කතා පුවත් මිනර්වා නාට්‍යවලට ප්‍රස්තුත විය.
(4) ගාබ්‍රියෙල් ප්‍රනාන්දු මිනර්වා නාට්‍ය රචකයෙකි.
(5) ග්‍රේටා ජෙනට් සිල්වා හා ජෙමිනි කාන්තා මිනර්වා නාට්‍යවල රඟපෑවේ නැත. (.........)

14. නාඩගමෙහි ප්‍රභවය පිළිබඳ වඩාත් නිවැරදි මතවාදය අඩංගු වරණය කුමක් ද?
(1) දකුණු ඉන්දියාවේ තෙරුක්කුත්තු ගැමි නාටකය ඇසුරෙන් නිර්මාණය වී ඇත.
(2) සංස්කෘත නාට්‍යයේ ආභාසයෙන් ප්‍රභවය වී ඇත.
(3) යුරෝපීය ජනච්ඡන්දනා නාට්‍ය ආශ්‍රයෙන් ප්‍රභවය වී ඇත.
(4) සොකරි, කෝලම් ආදී ගැමි නාට්‍ය ආභාසයෙන් ප්‍රභවය වී ඇත.
(5) කිසිදු විදේශ ආභාසයකින් තොර ව දේශීය ව ප්‍රභවය වී ඇත. (.........)

15. සිරිසේන විමලවීර විසින් නිෂ්පාදනය කරන ලද ටීටර් නාට්‍ය සඳහා සංගීත අධ්‍යක්ෂණය කළේ කවුද?
(1) විශ්වනාත් ලෞජී (2) සදා සිවන් (3) නවාබ් ඛාන්
(4) මෝහන් ලාල් (5) මොහමඩ් ගෞස් (.........)

16. ඇන්ටන් චෙකොව්ගේ අනුවර්තන සිංහල නාට්‍ය ඇතුළත් වරණය කුමක් ද?
(1) ඉබේ වේදා, හැංගි හොරා, මුදලාලිගේ පෙරළිය
(2) දුටුගැමුණු, නගරයෙන් කෙතට, මායාවතී
(3) රහස් කොමසාරිස්, බහින කලාව, වෙද හටන
(4) වලහා, මඟුල් ප්‍රස්තාව, මැහෙන්ජර්
(5) පබාවතී, මනමේ, සුනේත්‍රා (.........)

17. ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය වේදිකාගත කිරීමේ දී ජීවමාන නළු-නිළියන් ගේ රංගන දායකත්වය ලබා ගත්තේ පහත සඳහන් කුමන අවස්ථාව දක්වා ද?
(1) පිලාත් ගේ නඩු තීන්දුව දක්වා
(2) අවසාන රාත්‍රී භෝජනය දක්වා
(3) ජේසුතුමා ගල් කණුවේ බැඳ කස පහර දීම දක්වා
(4) කුරුසියේ ඇණ ගැසීම දක්වා
(5) ගල්ලෙනේ තැන්පත් කිරීම දක්වා (.........)

18. ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය කලාව සම්බන්ධයෙන් වැදගත් වන 'දුක්ප්‍රාප්ති ප්‍රසංගය' නම් ගද්‍ය කාව්‍ය රචනා කළේ කවරෙක් ද?

(1) ක්ලෙමන්ට් ප්‍රනාන්දු (2) ජාකොමේ ගොන්සාල්වේස් (3) මෙරිල් ප්‍රනාන්දු
(4) ලෙස්ලි බොතේජු (5) ලෝරන්ස් පෙරේරා (.........)

19. දීපාවලී උත්සවයේ දී නිරූපණය වන නාට්‍යමය අවස්ථාව කුමක් ද?

(1) ගවයකු වෙනුවෙන් පවත්වන පුද පූජා
(2) නරකාසුරන් සහ විෂ්ණු අතර සටන
(3) ස්කන්ද කුමාර හා සූරන් අතර සටන
(4) පංච පාණ්ඩවයන් ද්‍රෞපදිය හා වනවාසී වීම
(5) වට්ටෙයි තිරුවිලා නම් වූ දඩයම් අවස්ථාව නිරූපණය (.........)

20. 'කත්තාගි කුත්තු' නම් දෙමළ ජන නාටක ලංකාවේ කවර කලාපයක ව්‍යාප්ත වී පවතින්නක් ද?

(1) මඩකලපුව (2) යාපනය (3) මන්නාරම (4) වන්නි (5) උඩරට (.........)

21. කෘෂිකාර්මික ජන ජීවිතය හා සම්බන්ධ දෙමළ ජන නාටක විශේෂය කුමක් ද?

(1) වඩමෝඩි (2) තෙන්මෝඩි (3) මකිඩි
(4) කාත්තවරායන් කුත්තු (5) වසන්තන් කුත්තු (.........)

22. නාටක අරංකන් කල්ලූරි නම් නාට්‍ය ආයතනය පිහිටුවීමට මූලික ව කටයුතු කෙළේ,

(1) කේ. සිවතම්බි ය. (2) එස්. මෞනගුරු ය. (3) චෞර්ණලිංගම් ය.
(4) එස්. විද්‍යානන්දන් ය. (5) එම්. ෂන්මුගලිංගම් ය. (.........)

23. දේවදාසී ලෙසින් ගෘහිණියන් දේවදාසයකු ලෙස ගෘහපතියාත් මූලිකත්වය ගෙන කටයුතු කරන දෙමළ ආගමික උත්සවය කුමක් ද?

(1) තෛපොංගල් (2) හින්දු අලුත් අවුරුද්ද (3) මාටු පොංගල්
(4) මහා ශිව රාත්‍රි (5) නවරාත්‍රි මංගල්‍යය (.........)

24. සංස්කෘත නාට්‍යවල වේදිකාව මත එක් චරිතයක් තවත් එක් චරිතයකට පමණක් ඇසෙන සේ කතා කිරීම කවර භාෂණයක් වේද?

(1) ප්‍රකාශ (2) අපවාරිත (3) ස්වගත (4) ජනාන්තික (5) ආකාශභාෂිත (.........)

25. මධ්‍යම පාන්තික හා පහත් පවුල්වල සිදුවිය හැකි කතා පුවත් අන්තර්ගත සංස්කෘත නාට්‍ය ප්‍රභේදය කුමක් ද?

(1) නාටක (2) ප්‍රකරණ (3) ඩිම (4) සමවකාර (5) ප්‍රහසන (.........)

26. ස්වප්නවාසවදත්ත නාටකයෙහි මුඛ්‍ය රසය වන්නේ,

(1) ශෘංගාර රසය යි. (2) හාස්‍ය රසය යි. (3) කරුණ රසය යි.
(4) රෞද්‍ර රසය යි. (5) වීර රසය යි. (.........)

- පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක **27** සිට **31** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | භාණ | F | ස්වප්නවාසවදත්ත | K | ඊහාමෘග |
| B | චාරුදත්ත | G | ප්‍රියදර්ශිකා | L | ශකාර |
| C | පංචරාත්‍ර | H | ව්‍යායෝග | M | ඌරුභංග |
| D | රත්නාවලී | I | වසන්තසේනා | N | නාගානන්ද |
| E | ප්‍රතිඥායෞගන්ධරායණ | J | දූතඝටෝත්කච | O | අවිමාරක |

27. රූපක ප්‍රභේද තුන කුමක් ද?

(1) A,I,O (2) A,H,K (3) B,F,K (4) C,F,L (5) C,H,L (.........)

28. 'මහාභාරතය' නම් කෘතිය පදනම් කරගත් නාට්‍ය තුන කුමක් ද?

(1) B,G,M (2) C,J,O (3) C,J,M (4) D,I,M (5) E,H,M (.........)

29. බෘහත්කතාව ආශ්‍රයෙන් රචිත නාට්‍ය තුන කුමක් ද?

(1) A,F,L (2) B,I,O (3) C,F,K (4) C,J,M (5) E,F,O (.........)

30. ශ්‍රී හර්ෂ විසින් රචිත නාට්‍ය තුන කුමක් ද?

(1) B,G,N (2) C,E,O (3) D,I,L (4) D,G,N (5) E,G,N (.........)


31. මෘච්ඡකටික නාට්‍යයේ ප්‍රධාන චරිත තුන කුමක් ද?

(1) B,I,L (2) B,F,G (3) D,I,L (4) F,G,I (5) G,I,L (.........)

32. සංස්කෘත නාට්‍යකලාවේ දී යමෙකු කැඳවීම, ස්ථිරසාර බව, සුවඳ ආඝ්‍රාණය කිරීම ආදිය නිරූපණය පිණිස යොදාගනු ලබන හස්තය කුමක් ද?
(1) ත්‍රිපතාක (2) අංජලී (3) අරාල (4) පුෂ්පපුට (5) පද්මකෝශ (.........)

33. සංස්කෘත නාට්‍ය කලාවට අනුව වේදිකාවේ සිටගන්නා ඉරියව් හැඳින්වෙන පාරිභාෂික පදය කුමක් ද?
(1) චාරි (2) ගති (3) ස්ථානක (4) කරණ (5) ස්තම්භ (.........)

- පහත දැක්වෙන ජපන් රඟමඬලේ ආකෘතිය මත අංක 34 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




34. A ලෙසින් නම් කර ඇති කොටස භාවිතයට ගන්නේ,
(1) වාදක මණ්ඩලයේ සිවුදෙනාට රැඳී සිටීමට ය.
(2) අට දෙනකුත් ගෙන් සමන්විත ගායක පිරිසට රැඳී සිටීමට ය.
(3) ෂිතෙට රඟපෑම් සඳහා වෙන් ව තිබෙන ස්ථානය යි.
(4) බටනලා වාදකයා රැඳී සිටින ස්ථානය යි.
(5) රහස් උමං දොරටු පිහිටා ඇති ස්ථානය යි. (.........)

35. B ලෙසින් නම් කර ඇත්තේ,
(1) ෂිතෙ බෂිර ය. (2) වකි බෂිර ය. (3) මෙත්සුකෙ බෂිර ය.
(4) ෆුඑ බෂිර ය. (5) කම්තෙය ය. (.........)

36. C ලෙසින් නම් කර ඇත්තේ,
(1) වාදක මණ්ඩලය රැඳී සිටින ස්ථානය යි.
(2) ක්යෝගන් රංග ගත කරන ස්ථානය යි.
(3) ගායක කණ්ඩායම් පිවිසෙන දොරටුව යි.
(4) ජිඋතයිෂ සඳහා පැමිණීමට පිටවීමට ඇති දොරටුව යි.
(5) කැටපත් කාමරයට පිවිසීමට ඇති තිරය යි. (.........)

37. D ලෙසින් නම් කර ඇත්තේ,
(1) මවරි බූතයි ය. (2) අහෙමකු ය. (3) හනමිචිය ය.
(4) හෂිගකරි ය. (5) සෙරි ය. (.........)

38. E ලෙසින් නම් කර ඇත්තේ,
(1) කකිවරි ය. (2) අගෙමකු ය. (3) කගමිඉත ය.
(4) අතොස ය. (5) ෂිරසු ය. (.........)

39. කබුකි නාට්‍ය සඳහා භාවිත වන කුමදොරි නම් අංග රචනා විලාස සංඛ්‍යාව නිවැරදි ව අඩංගු වරණය කුමක් ද?
(1) 85 (2) 112 (3) 115 (4) 122 (5) 126 (.........)

40. කබුකි නාට්‍ය කලාවේ ජිදයිමොනො ලෙසින් හඳුන්වන්නේ,
(1) වෙළෙඳුන් ගේ හා ගේෂාවන් ගේ චරිත පාදක කරගත් නාට්‍ය වේ.
(2) සූදුකාරයන් හා මංකොල්ලකරුවන් පාදක කරගත් නාට්‍ය වේ.
(3) නුදු නැටුම් ප්‍රධාන කරගත් නාට්‍ය වේ.
(4) ඓතිහාසික කතා පුවත් ඇතුළත් නාට්‍ය වේ.
(5) පිරිමි චරිත පමණක් පාදක කරගත් නාට්‍ය වේ. (.........)

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

විෂය අංකය / பாட இலக்கம்: **57 - I**

විෂයය / பாடம்: **නාට්‍ය හා රංග කලාව I**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 2 | 21. | 5 | 31. | 1 |
| 02. | 5 | 12. | 3 | 22. | 5 | 32. | 3 |
| 03. | 1 | 13. | 3 | 23. | 1 | 33. | 3 |
| 04. | 5 | 14. | 1 | 24. | 2 | 34. | 1 |
| 05. | 2 | 15. | 5 | 25. | 2 | 35. | 2 |
| 06. | 2 | 16. | 4 | 26. | 3 | 36. | 5 |
| 07. | 1 | 17. | 1 | 27. | 2 | 37. | 4 |
| 08. | 3 | 18. | 2 | 28. | 3 | 38. | 3 |
| 09. | ~~5~~ 2 | 19. | 2 | 29. | 5 | 39. | 3 |
| 10. | 5 | 20. | 4 | 30. | 4 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

# නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

## II කොටස

### A කොටස

1. (i) අභිඥාන-ශාකුන්තලයේ අන්තර්ගත අංක සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි.)

අංක 07යි.

(ii) එහි සිවුවැනි අංකයේ අන්තර්ගතය සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි.)

අංකය ආරම්භ වන්නේ අනසුයා හා ප්‍රියංවදා මල් නෙළීම නිරූපණය කරමින් වේදිකාවට පැමිණෙන දර්ශනයකිනි. ඔවුන් දෙදෙනාගේ කතා බහින් දුෂ්‍යන්ත රජු ආපසු හස්තිනා පුරය බලා ගොස් ඇති බව සැලවේ. මල් නෙළීම අවසන් වනවාත් සමඟ දුර්වාසස් ගේ සාපය ඇසේ. සාපය කොට කේන්තියෙන් පිටව යන දුර්වාසස් පසු පස ප්‍රියංවදා දිව ගොස් ශාපයේ බරපතළකම අඩු කරවාගෙන ආපසු පැමිණේ. ඒ අනුව සකුන්තලාට දුන් කිසියම් සිහිවටනයක් (අභිඥානයක්) දුටහොත් ඔහුට යළි ශකුන්තලා මතක් වන බවට ඉන් කියවේ. මේ සිද්ධිය ශකුන්තලාට නොකියා සිටීමට ඔවුහු වගබලා ගනිති.

මේ වන විට කණ්ව කුලපති තුමා ආපසු පැමිණ ඇති බැවින් ශකුන්තලාට ඇය ගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වෙත පෙරහැරකින් දුෂ්‍යන්ත වෙත යවන්නට තීරණය කර ඇති බවත් දැනගන්නට ලැබේ.

අංකයේ ඉතිරි කොටසින් නිරූපණය වන්නේ ශකුන්තලා පෙරටු කරගත් තවුස් පෙරහැර තපෝ වනයේ සීමාව දක්වා යන අයුරු, සකුන්තලා ඇතුළු පිරිස නොපනී ගිය පසු කණ්ව කුලපති අනසුයා හා ප්‍රියංවදා ද කැටුව ආපසු අසපුව කරා යන්නට හැරී ගිය අයුරුත් නිරූපණය වේ. සකුන්තලාගෙන් වෙන් වීම ඔහුට දරාගන්නට අපහසු වූවත් ඇය ඇයට ගැළපෙන ස්වාමිපුරුෂකුට පාවාදිය හැකි වීම තමාට ලොකු අස්වැසිල්ලක් බව පැවසීමෙන් අංකය සමාප්ත වේ.

කරුණු 3ක් දක්වා ඇත්නම් 3 උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් 6.

(iii) එය නාටකයේ හොඳ ම අංකය ලෙස විචාරකයන් පවසන්නේ කවර හෙයින් ද? (ලකුණු 07 යි.)

අභිඥානශාකුන්තලයේ සිවු වැනි අංකය ඉතා රමණීය අංකය බව පැවසෙන්නේ විශේෂයෙන් මානුෂික හැඟීම් දැනවීමේ ලා කාලිදාස දක්වා ඇති කෞශල්‍යයේ හේතුවෙනි. ශකුන්තලා මනාලියක සේ සරසනු ලබන විට දුර්වාසස් ගේ සාපය ප්‍රේක්ෂකයාට අමතක වී ගොස්ය. උදෑසන නහා ගොඩ වුණු කණ්ව තවුසාට අද තම දියණියන් අසපුවෙන් යන බව මතක් වන විට ඔහු ගේ හදවත තැවෙයි. ඇස් කඳුළින් පිරී ඇත. උගුර හිර වී ඇත. කැලේ වසන තවුසකු වන තමාට මෙසේ නම් සිය දියණියන් තමන් හැර යන විට ගිහියකුට කෙසේ වාවා ගත හැකි දැයි අසයි. ඇත්ත වශයෙන් ම එම අත්දැකීම ලබා ඇති ගිහියකුට එය තදින් ම දැනේ.

පෙරහර යන අතරමග දී තපෝ වනයේ ගස් වැල් අමතා, ඔබට දිය බිඳක් නො දී කිසිදින පිපාසය නොනිවාගත් ඇඟ සරසාගන්නට ඔබෙන් ළපල්ලක් නොම සිඳගත්, එහි පළමු මල් හටගැන්ම උත්සවයක් සේ සැලකූ ශකුන්තලා අද ඔබ හැර යනවා. ඇයට ඔබ සියලු දෙනා සුබ පතන්නයි කණ්ව පවසයි. මෙයින් සොබාදහමට කාලිදාස දැක්වූ ආදරය පළට වේ. එවිට වනයේ ඇසෙන කොවුල් හඬ ශකුන්තලාගේ වියෝ

වීම නිසා නැගෙන දුක් හඬකින් පවසන්නට තරම් කණ්ව කුලපති විචක්ෂණ වූ බව පෙනේ. ඒ සමඟ මැ අහසින් නැගෙන ශකුන්තලාට සුබ ගමන් පැතීමේ හඬ දූර්වාසස් ගේ ශාපය යටපත් කිරීමට හේතු වේ. තව ද ශකුන්තලා යන විට ඇය හදාවඩාගත් මුව පොව්වා ඇගේ සාරියෙන් අදින අයුරු, අලුත් නිවසට ගිය පසු ජීවත් විය යුතු ආකාරය පිළිබඳ පියතුමා දෙන උපදෙස් හා ශකුන්තලා හා පිරිස නොපෙනීයත්ම අනසූයා හා ප්‍රියංවදා සමඟ ආපසු හැරුණු පියතුමා "දරුව, ඔබ සතුනට බිලි පුද සේ අසපුවේ දොරකඩ ලූ උෟරු සහල් පැළ වී ඇති සැටි දකින මම් කෙසේ ඉවසම් ද" පැවසීම ආදිය, තවුසනට වුවද එවන් මානුෂික හැඟීම් දරා ගත නොහැකි අයුරු කාලිදාස දක්වා ඇති ආකාරය අතිශයින් ප්‍රශස්තය. මේ අයුරින් කණ්ව තවුසා ගේ ප්‍රකාශයේ සිට අංකය අවසන් වන තුරු පියවරෙන් පියවර මානුෂික හැඟීම් උද්වේගකර අයුරින් නිරූපණය කිරීමට කාලිදාස දක්වා ඇති කුශලතාව නාටකයේ අන් සියලු අංක අභිබවා නැගීසිටීමට හේතු වී ඇත.

2. (i) ලෝකධර්මී සහ නාට්‍යධර්මී යනු කුමක් ද යි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

- ලෝක ව්‍යවහාරයට අනුව නාට්‍යයේ සිදුකෙරෙන සියලු ක්‍රියාකාරකම් ලෝක ධර්මීය වේ. භරත මෙසේ හඳුන්වයි. පාත්‍රයන් ස්වාභාවික ලෙස හැසිරෙන්නා වූ, අව්‍යාජ වූ, විකෘත නොවූ ලෝකයාගේ පැවැත්මෙන් මෙන් ම ක්‍රියාවෙන් ද යුක්ත වූ ලාලිත්‍යයෙන් යුතු අංගචලනයෙන් තොර වූ ස්වාභාවික අභිනයෙන් යුක්ත වූ නොයෙක් ස්ත්‍රීන් හා පුරුෂයන් පාත්‍රයින් සේ හැසිරෙන්නා වූ යම් නාට්‍යයක් වේද එය ලෝක ධර්මී නාට්‍යයක් ලෙස හැඳින්වේ.
- ස්වභාවිකත්වයෙන් ඈත් වූ සංවාද හා රඟපෑම් වලින් යුක්ත වූ, ලාලිත්‍යයෙන් යුතු සාමාන්‍ය අංගචලන වලින් ද ගායන හා වාදන ආදියෙන් අනූන වූ සංගීතයෙන් සමන්විත වූ නාට්‍ය නාට්‍ය ධර්මී වේ.

(ii) නාට්‍යධර්මී නාට්‍යයක වේදිකාව මත පරිසරය නිර්මාණය කරන ආකාරය අභිඥානශාකුන්තලයෙන් නිදසුන් දෙමින් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

- ගද්‍ය හා පද්‍ය සංවාද මගින් පරිසරය මවාපානු ලැබේ. ශාකුන්තලය නාට්‍යයේ තපෝ වනය මාලනී ගං ඉවුර හේමකූට පර්වතය මැවීම නිදසුන්ය. හත් වන අංකයේ රථාරූඪ රජු සහ මාතලී අහස් රියෙන් පිවිසීම හා හේමකූට පර්වථයට රථය බැස්සවීම.
- කක්ෂ්‍යා විභාගය, පරික්‍රමණය මගින් ද පසුතලය පිළිබඳ ව දැනගැනීමට සලස්වයි.
- ආංගික අභිනය මගින් ද පරිසරය පිළිබඳ ව අවබෝධයක් ලබාදෙයි. ශකුන්තලා සහ ඇගේ හෙහෙළියන් මල්වලට වතුර වත් කිරීම අභිනය මගින් ඉදිරිපත් කරන විට පරිසරය පිළිබඳ අවබෝධයක් ලැබේ.
  උදා : සිවු වැනි අංකය ආරම්භයේ ප්‍රියංවදා හා අනසූයා මල් නෙළීම නිරූපණය කිරීම හා ශකුන්තලා සැරසීම

**(iii)** **නාට්‍යධර්මී නාට්‍යයක රඟපෑම සඳහා රූපණ ශිල්පියෙකු තම කුශලතා ප්‍රගුණ කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.** **(ලකුණු 07 යි.)**

- නර්තනමය කුසලතාව ය ප්‍රගුණ කළ යුතු ය.
- ගායන කුශලතාව ද වර්ධනය කළ යුතු ය.
- ආංගික හා සාත්වික අභිනය මැනවින් ගෙනහැරපෑමේ කුශලතාව ප්‍රගුණ කළ යුතු ය.
- විවිධාකාර වූ මුද්‍රා භාවිතයන් පිළිබඳ ව අවබෝධය හා හැකියාව මැනවින් ප්‍රගුණ කළ යුතු ය.
- විවිධ චරිත රඟපෑමේ කුශලතාව ප්‍රගුණ කළ යුතු ය.
- විවිධ වූ භාෂණ ක්‍රම ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රගුණ කළ යුතු ය.
- විවිධ වූ ද්‍රව්‍ය හා වස්තු අනුරූපණය මගින් ප්‍රේක්ෂකයාට මවාපෙන්වීමට ඇති හැකියාව ප්‍රගුණ කළ යුතු ය.

**3.** (i) කුවේණි නාට්‍යයේ ගායක කණ්ඩායමෙන් සිදුවන කාර්යභාරයන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

- වේදිකාවේ නිරූපණය කළ නොහැකි අවස්ථා හා සිද්ධීන් පිළිබඳව ප්‍රේක්ෂකයා ගේ අවධානය යොමු කිරීම.
- ප්‍රේක්ෂකයා ගේ විමසුමට ලක් විය යුතු දාර්ශනික මතවාද ගායක පිරිස ලවා ඉදිරිපත් කිරීම.
- ඉතිහාසගත සිදුවීම් යළි ආකර්ෂණීය ලෙස මතක් කරදීම. (අතීතාවර්ජනයන්)
- මනා ප්‍රේක්ෂාවක් ප්‍රතිනිර්මාණය කිරීම.

උදාහරණ :

i. ගලින් ගල ගටාලා - අන්ධකාරය අතීතයේ

................................

මිනිස් ඉතිහාසයේ වැදගත් ම සංසිද්ධියක් වූ ගලින් ගල ගටා ගින්න සොයා ගැනීමේ සිට මිනිසාගේ බුද්ධිය විකාසනය වී මුළු ලෝකය පමණක් නො ව අජටාකාශය හා විශ්වය දක්වා පැතිරීගිය ද යළි ස්වකීය මූලය සොයා අතීතය වෙත යන ආකාරය පවසන්නේ ගායන වෘන්දය යි. එය දාර්ශනික මතවාදයන් ඉදිරිපත් කිරීමකි.

ii. කතා වින්‍යාසය මැනවින් හැඩගස්වා ගැනීම හා අතීත කතාවේ සිදුවීම් ප්‍රතිනිර්මාණය කිරීම ද ගායන වෘන්දයෙන් ඉටු කර ගන්නා කාර්යයකි.

**තොදන්නෝ කවුරුද කුවේණිය**
**ලොව වශී කල මායකාරිය**

අතීත කුවේණිය ගේ සම්මත අර්ථකථනය ගායක කණ්ඩායම මගින් ඉදිරිපත් කරනු ලැබේ.

iii. වේදිකාවේ රඟ දැක්විය නොහැකි අතීත සිදුවීම් ගායකයින් ලවා කියවීම.

**දරු දෙදෙන ජීවහත්ත දිසාලා**
**රඟෙන මඟ පිළිපත් කුවේණි**
**කෝප පත් නෑසියො සිහිව යළි**
**.....................................**

දරු දෙදෙනා අතරමඟ රඳවාගිය හේතුව මෙම ගායනාවෙන් හෙළි වේ. දරු දෙදෙනා එසේ හිඳගෙන සිටීම දක්වා අතීත කතාව මෙහි දී සැකෙවින් ගෙන හැර දක්වයි.

**(තර්කානුකූල ව කරුණු දක්වා ඇත්නම් ලකුණු 05යි.)**

(ii) කුවේණිය සංවේදී ගැහැණියක ලෙස ප්‍රේක්ෂකයාට හඳුන්වාදීමට නාට්‍යකරු කවර නාට්‍යමය උපක්‍රම භාවිත කළේ දැ යි විමසන්න. (ලකුණු 05 යි.)

i. කුවේණිය දරු දෙදෙනා ද සමඟ සිය කැමැත්තෙන් ම මාළිගයෙන් පිට ව යාම. එසේ යාමේදී විජය හට වෛර නොකිරීම.

ii. පළමු වැනි අංකයේ එන **නොහඩනු කුමරුනි ඇවිල ලසෝ ගිනි** ගීයෙන් කුවේණිය තමා පෙම් සටනින් පැරදුණු බව පිළිගන්නා අවස්ථාව ද දැක්විය හැකි ය.

iii. කුවේණිය ගේ දරුවන් ලවා මව පිළිබඳ ව සඳහන් කැරවීම.
**"මුදු මොළොක් මල මෙනේ**
**කුස දරා බැති පෙමින් "**
මාතෘත්වය කැටි කොටගත් අහිංසක සාධු චරිතයක් ලෙස ඉදිරිපත් කිරීම.

iv. දෙවන අංකයේ උසාවියට පැමිණෙන කුවේණිය හැසිරෙන ආකාරය ද ඇය සංවේදී ගැහැණියක බව පෙන්වීමට ගත් උත්සාහයකි. ආත්මගත ආදරය සොයා සාධාරණ විනිශ්චයක් පතා එන කුවේණිය සිය සැමියාම පතාසිටී.

v. අවසන් අංකයෙහි කුවේණිය සිය දරුවන් සොයා පැමිණ ඇත. ඇය ගේ වේෂ භූෂණ අනුව දෙවන අංකයේ සිටි කුවේණිය ම බව ප්‍රේක්ෂකයාට පැහැදිලි වේ. මෙසේ මවක් අවසානයේ තම දරුවන් සොයා පැමිණීම ද ප්‍රේක්ෂකයාට ඇය කෙරෙහි සංවේදීභාවයක් ඇති කරලීම සඳහා නාට්‍යකරුවා යොදාගත් උපක්‍රමයක් විය හැකි ය.

**(උදාහරණ සහිතව සාකච්ඡා කර ඇත්නම් ලකුණු 05)**

(iii) පෙරදිග ගැහැණියක ගේ චරිත ස්වභාවයන් කුවේණි චරිතය ඇසුරින් ඉස්මතු කරලීමට නාට්‍යකරු උත්සාහ කොට ඇති දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

- මුල් අංකය අවසානයේ ඇය මෛත්‍රී සහගත සිතින් විජයගෙන් සමුගෙන යාම.
- සිය කැමැත්තෙන් ම එසේ පිට ව යන විට දරුවන් දෙදෙනා ද කැටුව යාම යහපත් මාතෘත්වයේ ලක්ෂණයකි.

- ගායන වෘන්දය ලවා කියැවෙන පරිදි කුවේණි නෑසියන් හමුවට ගියේ ද දරු දෙදෙනා ගේ ආරක්‍ෂාව සඳහා ඔවුන් අතරමඟ නවතා යැමෙනි. එයින් ද පෙරදිග ගැහැණිය ඉස්මතු වේ.
- දෙවන අංකයේ උසාවියට පැමිණි කුවේණිය හැසිරෙන ආකාරය ද පෙරදිග ගැහැණියක නියෝජනය කරයි.
- ස්වාමියා ගේ අකටයුතුකම්, අසාධාරණකම් හමුවේ වුව ද ඉවසාගෙන උපේක්‍ෂා සහගත ව කුටුම්බය රැකගැනීමට උත්සාහ දරන්නේ පෙරදිග ගැහැණියයි.

මෙවැනි කරුණු මගින් නාට්‍යකරුවා උත්සාහ කර ඇත්තේ කුවේණි චරිතය තුළින් පෙරදිග කාන්තාවට ආවේණික ගුණාංග ඉස්මතු කිරීමට බව පැහැදිලි වේ.

කරුණු 3ක් ..

***(තර්කානුකූල ව ලියා ඇත්නම් ලකුණු 05)***

**B කොටස**

4. (i) කබුකි නාට්‍ය සඳහා භාවිත කෙරෙන සංගීත ක්‍රම **හතර** නම් කරන්න. (ලකුණු 04 යි.)

i. ගිදයු
නගඋත
නොකිවසු
කියොමොතො

(ii) කබුකි රංග ශෛලියේ ප්‍රධාන ලක්‍ෂණ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි.)

- නාට්‍යධර්මී රංග ශෛලියකට අනුගත වීම.
- පුරුෂයන් පමණක් රංගනයට සහභාගී වීම.
- රංග ශෛලියට ගැළපෙන ආකාර වේදිකාවක් භාවිත කිරීම.
- විශේෂ අංග රචනා ක්‍රමයක් භාවිත කිරීම. (විලාස 15)
- එන්ගෙකි හා බුයොගකි වශයෙන් නාට්‍ය ප්‍රභේද වීම හා ඒ අනුව නාට්‍ය ශෛලියේ වෙනස්කම් ලැබීම.
- ගද්‍ය සංවාද අවම වීම, සංවාද උච්චාරණය රිද්මයානුකූල වීම.
- නළුවන් ගායනා නොකිරීම සහ ගායනය සඳහා ගායක කණ්ඩායමක් සිටීම.

කරුණු 4 දක්වා ඇත්නම් ලකුණු 2 විස්තර කර ඇත්නම් 4

(iii) කබුකි නාට්‍යයේ ප්‍රේක්ෂාව ජනතය සඳහා භාවිත රංගෝපක්‍රම විස්තර කරන්න. (ලකුණු 07 යි.)


- වේෂ භූෂණ
- අංග රචනා
- රංගාලෝකය
- මවරි බූතයි හෙවත් කැරකෙන වේදිකාව සහ හානමිචි
- රඟපෑමේ සමකාලය

- චිත්තාකර්ෂණීය දර්ශන කළ ප්‍රයෝග භාවිතය කක්වරි
- භාවිතා කරන වේදිකා උපකරණ "ඔදොගු හා කොදොගු"
- කබුකිවලට ආවේණික පසුතල හා අලංකරණය (රජ මාලිගා / ගංගා / ප්‍රසාද / සල්පිල් ආදියද වර්ෂාව, හිමපතනය, ඔරු පැදීම, දෝලා, අශ්වයන් පිට යෑම වැනි)

කරුණු 5ක් විස්තර කර ඇත්නම් එකකට ලකුණු 7ක් ලබාදෙන්න.

5. (i) තුර්කි සංගීතඥයින් හතර දෙනකු නම් කරන්න. (ලකුණු 04 යි.)

1. ගුජරාටයේ පන්ඩිත් අම්මාලාල්
2. සදා ලාල්
3. මදන් ලාල්
4. මෝහන් ලාල්
5. සුල්තාන් බක්ස්
6. අබ්දුල් සතාර්
7. සදා සිවන්
8. විශ්වනාත් ලව්පි
9. නවාබ් ඛාන්
10. ඩබ්ලිව්. සතාසිවම්
11. එච්.ඩබ්ලිව් රූපසිංහ



ලකුණු 4ක්

ii) ජෝන් ද සිල්වා සූරීන් සිංහල නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දැක්වූ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 05 යි.)

1. විනෝදාස්වාදය ඉක්මවා ගිය සමාජීය හා ජාතික ප්‍රබෝධයක් සහිත ව නාට්‍ය කිරීමට නාට්‍ය කරුවන් පෙළඹවීම.
2. නාට්‍ය කෘති මුද්‍රණය කිරීම ආරම්භ වීම.
3. නාට්‍ය හා බැඳුණු රංගභූමි ශිල්ප භාවිතය දේශීය නාට්‍යකලාව තුළ ප්‍රවර්ධනය වීම.
4. නාට්‍ය කලාව වෘත්තීය කලාවක් බවට පත්කිරීමට පදනම වැටීම
5. නාට්‍ය කලාව වාණිජකරණය කිරීමට මගපෑදීම
6. නාට්‍ය කලාව තුළ සංගීතය ප්‍රබලව යොදාගැනීමට නාට්‍යකරුවන් යොමුවීම
7. ෂේක්ෂ්පියර් නාට්‍ය, සංස්කෘත නාට්‍ය වැනි උසස් නාට්‍ය කෘති පරිහරණයට යොමු වීම.
8. නව රංග ශෛලියක් බිහිවීම
9. සිංහල ආර්ය සුබෝධ නාට්‍ය සමාගම (1902 දී) පිහිටුවීම.

කරුණකට එක් ලකුණ බැගින් උපරිමය ලකුණු 3ක් ලබාදෙන්න.
කරුණු 3ක් විස්තර කර ඇත්නම් ලකුණු 05ක් ලබාදෙන්න.

**(iii) නාඩගම් අභිබවා නූර්තිය ජනප්‍රිය වීමට බල පෑ සාධක පිළිබඳ සාකච්ඡා කරන්න.** (ලකුණු 06 යි.)

1. දින 3-7 අතර කාලයක් රාත්‍රිය පුරා ම රඟ දක්වන ලද නාට්‍ය වෙනුවට පැය 2, 3 කට සීමාවූ රංගයක් වීම.
2. ගෘහස්ත රංග ශාලාවක නැරඹීමට හැකියාව ලැබීම.
3. ජවනිකා වෙනස් කිරීමට විචිත්‍ර වූ චිත්‍ර වස්ත්‍ර භාවිතා කිරීම.
4. අවස්ථා නිරූපණය සඳහා විවිධ රංගෝපකරණ මෙන්ම යාන්ත්‍රික උපකරණ යොදා ගනිමින් මනා ප්‍රේක්ෂාවක් මැවීම.
5. ඒකාකාරී රාගතාල මිශ්‍රිත ගායනාවලින් මෙන්ම සංගීතයෙන්ද යුතු වූ අතර කණ පිනවන මිහිරි හින්දුස්තානි සංගීතයට ප්‍රේක්ෂකයා ප්‍රියවීම.
6. රංගනය සඳහා කාන්තාවන් සහභාගි කරවාගැනීම.
7. වේෂ නිරූපණ රංගභූමි අලංකරණ, වේෂභූෂණ ඉතා ම විචිත්‍ර අයුරින් යොදාගැනීම.
8. නාඩගමේ බහුභූතයා නූර්තියේ කවටයා ලෙසට පෙනී සිටීම.
9. නාඩගමෙහි ආකෘතියෙහි හා අන්තර්ගතයේ පිරිහීම ද නූර්තිය ප්‍රබල වීමට බලපෑ සාධකයකි.

(කරුණු 4ක් විස්තර කර ඇත්නම් ලකුණු 6ක් ලබා දෙන්න)

**6. (i) රට යකුම යාගය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු හතරක් ලියන්න.** (ලකුණු 04 යි.)

i. ස්ත්‍රීන් ගේ වඳ භාවය නැති කොට ඔවුන්ට දරු සම්පත් ලබාදීම.
ii. ගර්භිණී ස්ත්‍රීන් ගේ ගර්භයට ආරක්ෂාව ලබාදීම.
iii. දරු ප්‍රසූතිය පහසුවෙන් සිදු කිරීම සඳහා අවශ්‍ය මානසික ශක්තිය ලබාදීම.
iv. උපත ලැබූ දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීම

කරුණු 4 ක් ලියා ඇත්නම් ලකුණු 4ක්

**(ii) රට යකුමේ නාට්‍යමය අවස්ථා පැහැදිලි කරන්න.** (ලකුණු 05 යි.)

i. නානුමුරය (දොළහ පෙළපාලිය)
ii. කපු යක්කාරිය (කපු වියමන)
iii. දරු නැළවිල්ල යන අවස්ථා පැහැදිලි කර තිබීම

අවස්ථා දෙකක් කෙරියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5ක් ලබා

**(iii) රට යකුම සඳහා උපයෝගී කරගන්නා නාට්‍යෝපකරණ විස්තර කරන්න.** (ලකුණු 06 යි.)

ගොප් කොළ, කෙසෙල් පතුරු ආදිය උපයෝගී කරගෙන තැනූ උපකරණ හා ලීයෙන් තැනූ බෝනික්කන් ආදිය නාට්‍යෝපකරණ වේ. ඒ අනුව උනුනු පියන වට්ටිය, තෙල් කුප්පිය, පනාව, කැඩපත, හවරිය, මාල, වළලු, තෝඩු, කොන්ඩ කූරු, සබන් කෑල්ල, ආදිය , කලය

❖ කපුයක්කාරියේ දී භාවිතා කරන ඉද්ද, රොද්ද, චවුන්න, නඩාව, කපු කටින යන්ත්‍රය ආදිය උපයෝගි කරගන්නා ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු 6 ලබා දෙ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

**57 S II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..............................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

※ I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

※ එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

1. "නාට්‍යය යනු ජීවිතයේ පැතිකඩකි" යනුවෙන් නිර්වචනය කළේ,
(1) ඇරිස්ටෝටල් ය. (2) බර්නාඩ් ෂෝ ය. (3) ඇලඩයිස් නිකොල් ය.
(4) ඇල්බෙයා කැමූ ය. (5) අර්නස්ට් පිස්කැටර් ය. (..........)

2. ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයේ ඛේදාත්ම නාට්‍ය පිළිබඳ විස්තර ඇතුළත් පරිච්ඡේදය වන්නේ,
(1) පළමුවැනි පරිච්ඡේදය යි. (2) දෙවැනි පරිච්ඡේදය යි. (3) පස්වැනි පරිච්ඡේදය යි.
(4) සවැනි පරිච්ඡේදය යි. (5) දසවැනි පරිච්ඡේදය යි. (..........)

3. නාට්‍ය රචනයේ දී දේශ වාත්සල්‍යය ගැඹුරින් ප්‍රකට කළ රචකයා වන්නේ,
(1) ඊස්කිලස් ය. (2) සොෆොක්ලීස් ය. (3) යුරිපිඩීස් ය.
(4) ඇරිස්ටොෆනීස් ය. (5) ප්‍රටිනස් ය. (..........)

4. ග්‍රීක රංග භූමියේ ප්‍රේක්ෂකයන් සඳහා වෙන් වූ ආසන හැඳින්වුණු නාමය කුමක් ද?
(1) පැරඩොයි (2) ක්ලිමෙකිස් (3) පැරස්කිනියා
(4) කයිලිලි (5) මේකිස් (..........)

5. 'ඊඩිපස් රජ' නාට්‍යයේ රංග භූමිය මත නිරූපණය කරන්නට ඇත්තේ මින් කුමන අවස්ථාව ද?
(1) ස්ෆින්ක්ස් දිවි නසාගැනීම (2) ලායිශුස් රජු ඝාතනය කරනු ලබන අවස්ථාව
(3) ජොකස්ටා ගෙල සිර කරගැනීම (4) දෙනෙත් අඳ වූ ඊඩිපස් ප්‍රේක්ෂකයාට දර්ශනය වීම
(5) ඊඩිපස් දෙනෙත් අඳ කරගැනීම (..........)

6. ග්‍රීක ඛේදාත්ම නාට්‍යයක අවසානයට වේදිකාවෙන් පිට වී යන්නේ කවුද?
(1) වීරයා (2) ගායන වෘන්දය (3) පූජකවරයා
(4) ගායක නායකයා (5) පණිවුඩකරු (..........)

7. Everyman හෙවත් සකලජන යනු
(1) මිරකල් නාට්‍යයකි. (2) මොරැලිටි නාට්‍යයකි. (3) මිස්ටරි නාට්‍යයකි.
(4) එඬේර නාට්‍යයකි. (5) සාන්තුවරුන්ගේ නාට්‍යයකි. (..........)

[දෙවැනි පිටුව බලන්න

8. මිරකල් නාට්‍ය රඟ දක්වන ලද්දේ,
(1) පල්ලියෙන් පිටත ය. (2) පල්ලිය ඇතුළත ය. (3) කානායම්පොළවල ය.
(4) ප්‍රසිද්ධ උද්‍යානවල ය. (5) රාජ සභාවල ය. (.........)

9. මධ්‍යකාලීන යුගයේ වෙළෙඳ ශ්‍රේණි විසින් නාට්‍ය සංවිධානය කිරීමේ දී ජේසුස් වහන්සේ ගේ ස්වර්ගාරෝහණය සංවිධානය කළෝ,
(1) ඇණ සාදන්නෝ ය. (2) බක්කරේවරු ය. (3) සන්නාලියෝ ය.
(4) නැව් සාදන්නෝ ය. (5) පොත් බඳින්නෝ ය. (.........)

10. විචිත්‍රාද්භූත ප්‍රභේදයට අයත් විලියම් ශේක්ස්පියර් ගේ නාට්‍යය කුමක් ද?
(1) ද ටෙම්පස්ට් (2) මර්චන්ට් ඔෆ් වෙනිස් (3) ද මිඩ් සමර් නයිට්ස් ඩ්‍රීම්
(4) රෝමියෝ ජුලියට් (5) ඈස් යූ ලයික් ඉට් (.........)

11. විලියම් ශේක්ස්පියර් ගේ ප්‍රේක්ෂාගාරය සමන්විත වූයේ,
(1) ඉහළ මධ්‍යම පාන්තික ජනයා ගෙනි. (2) සියලු ම පන්ති වල ජනයා ගෙනි.
(3) රාජකීයන් හා ප්‍රභූන් ගෙනි. (4) පහළ මධ්‍යම පාන්තික ජනයා ගෙනි.
(5) වැඩ කරන පන්තියේ ජනයා ගෙනි. (.........)

- පහත සඳහන් නාට්‍ය නාම ඇසුරෙන් අංක **12** සිට **16** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A | කොර්නේලියා | F | ටැම්බලේන් |
| B | ෆ්‍රයර් බේකන් | G | ද වුමන් ඉන් ද මූන් |
| C | මදර් බොම්බි | H | ජේම්ස් ද ෆෝත් |
| D | ඩොක්ටර් ෆවුස්ටස් | I | ස්පැනිෂ් ට්‍රැජඩි |
| E | එව්රි මෑන් ඉන් හිස් හ්‍යුමර් | J | අ ටේල් ඔෆ් අ ටබ් |

12. ක්‍රිස්ටෝපර් මාලෝ විසින් රචනා කරන ලද නාට්‍ය දෙක වනුයේ,
(1) A සහ H ය. (2) B සහ I ය. (3) C සහ H ය. (4) D සහ F ය. (5) E සහ L ය. (.........)


13. තෝමස් කිඩ් විසින් රචනා කරන ලද නාට්‍ය දෙක වනුයේ,
(1) A සහ I ය. (2) A සහ H ය. (3) B සහ H ය. (4) D සහ J ය. (5) F සහ G ය. (.........)

14. රොබට් ග්‍රීන් විසින් රචනා කරන ලද නාට්‍ය දෙක වනුයේ,
(1) A සහ L ය. (2) B සහ G ය. (3) B සහ H ය. (4) E සහ H ය. (5) E සහ I ය. (.........)

15. ජෝන් ලයිලි විසින් රචනා කරන ලද නාට්‍ය දෙක වනුයේ,
(1) B සහ H ය. (2) B සහ J ය. (3) C සහ G ය. (4) D සහ L ය. (5) E සහ H ය. (.........)

16. බෙන් ජොන්සන් විසින් රචනා කරන ලද නාට්‍ය දෙක වනුයේ,
(1) A සහ H ය. (2) B සහ J ය. (3) C සහ J ය. (4) E සහ G ය. (5) E සහ J ය. (.........)

- පහත සඳහන් වේදිකා ආකෘතිය ඇසුරෙන් අංක **17** සිට **21** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



17. ඒප්‍රන් වේදිකාව දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) D (4) E (5) F (.........)

18. ප්‍රභූන් සඳහා වෙන්කළ ආසන දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) E (5) F (.........)

19. අධ්‍යයනාගාරය හෙවත් අභ්‍යන්තර වේදිකාව දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) C (2) D (3) E (4) F (5) G (.........)

20. නිරය දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) C (2) D (3) E (4) F (5) G (.........)

21. උමං දොරටු දැක්වෙන අක්ෂරය කුමක් ද?
(1) A (2) C (3) G (4) E (5) F (.........)

22. ජූලියස් සීසර් නාට්‍යයේ තුන්වැනි අංකයේ පළමු වැනි දර්ශනයේ "මාර්තු 15 නම් ආවා" යයි උපහාසයෙන් පවසන්නේ කවරෙක් ද?
(1) පේන කියන්නා (2) බ්‍රැටස් (3) ආටිමිඩෝරස්
(4) ජූලියස් සීසර් (5) කැසියස් (.........)

23. ඉතිහාසඥයකු හා දාර්ශනිකයකු වූ ප්ලූටාක් ගේ කෘතියක් ආශ්‍රයෙන් ශේක්ස්පියර් රචනා කළ නාට්‍යය කුමක් ද?
(1) ජූලියස් සීසර් (2) ඔතෙලෝ (3) හැම්ලට්
(4) මැක්බෙත් (5) ලියර් රජ (.........)

24. රොමැන්ටික් නාට්‍ය කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) භාවයට වඩා බුද්ධියට ප්‍රමුඛත්වය හිමි වේ.
(2) යෙව්ගිනි ෂ්වාර්ට්ස්ගේ 'The Dragon' රොමැන්ටික් නාට්‍යයකි.
(3) 18 වැනි සියවසේ පෙරදිග රටවල ආරම්භ වී බටහිරට ආ සංකල්පයකි.
(4) ස්වභාව සෞන්දර්යය, ආදරය වැනි තේමා පාදක නො වී ය.
(5) හෙන්රික් ඉබ්සන්ගේ 'The Ghost' රොමැන්ටික් නාට්‍යයකි. (.........)

25. ස්වාභාවිකවාදී නාට්‍ය රීතියට අනුව නිර්මාණය කරන ලද නාට්‍යය කුමක් ද?
(1) ද ගෝස්ට් (2) ගැලීලියෝ (3) ද බුවරිස්
(4) එනිමි ඔෆ් ද පීපල් (5) පිලර්ස් ඔෆ් සොසයිටි (.........)

26. නළුවකුගේ පෙරහුරුව (An Actor Prepares) නම් කෘතිය රචනා කළේ,
(1) ඇන්ටන් චෙකොව් ය. (2) ඔගස්ටෝ බොආල් ය. (3) මෙයර්හෝල්ඩ් ය.
(4) ඉයුජින් අයනෙස්කෝ ය. (5) ස්ටැනිස්ලාව්ස්කි ය. (.........)

27. යථාර්ථය ධ්වනිත කිරීම සඳහා තර්කානුකූල භාෂාව, සංවාද සහ ක්‍රියාවලට වඩා ප්‍රබල විකල්ප ක්‍රමවේදයක් හඳුන්වාදෙන ලද්දේ කුමන රංග රීතිය මගින් ද?
(1) සංකේතවාදය (2) ප්‍රකාශනවාදය (3) ආඛ්‍යාන රංගය
(4) අසම්මත රංගය (5) කුරිරු රංගය (.........)

28. නළුවා චරිතයට ආවේශ වීම පිළිබඳ සංකල්පය බැහැර කරමින් නව රූපණ ක්‍රමවේදයක් හඳුන්වා දුන් නාට්‍යකරුවා කවුද?
(1) වෝල්ටර් හේසන්ක්ලෙවර් (2) බර්ටෝල් බ්‍රෙෂ්ට් (3) මොරිස් මෙටර්ලින්ක්
(4) ඇන්ටන් චෙකොව් (5) ඇල්බෙයා කැමූ (.........)

29. අසම්මත නාට්‍ය රීතිය අනුගමනය කළ නාට්‍යකරුවන් පමණක් අන්තර්ගත වරණය කුමක් ද?
(1) මැක්සිම් ගෝර්කි, ලියෝ ටෝල්ස්ටෝයි, නිකොලායි ගොගොල්
(2) ටෙනසි විලියම්ස්, ආතර් මිලර්, දාරියෝ ෆෝ
(3) එඩ්වඩ් ඕල්බි, ආතර් ඇඩමොව්, ගුන්ත ග්‍රාස්
(4) අර්වින් පිස්කැටර්, ගුන්ත ග්‍රාස්, ලුයිජි පිරැන්ඩෙලෝ
(5) හෙන්රි බෙක්, ඉයුජින් ඕනෙල්, තෝන්ටන් වයිල්ඩර් (.........)

30. ප්‍රොසීනියම් වේදිකාවේ ගැඹුර මවාපෑම පිණිස මහත් සේ උපකාරී වන්නේ,
(1) ප්‍රධාන තිරය යි. (2) සයික්ලොරාමාව යි. (3) පැති තිරය යි.
(4) උඩු තිරය යි. (5) හරස් තිරය හෙවත් මැද තිරය යි. (.........)

**31.** අසම්මත රංග රීතියට අනුව නළුවකු රූපණයේ යෙදිය යුතු ආකාරය සඳහන් වරණය කුමක් ද?
(1) නළුවා වේදිකාව මත ප්‍රේක්ෂකයන් ඉදිරියේ රඟපෑම නො ව ජීවත් වීම රඟපෑම යි.
(2) නාට්‍ය පෙළෙහි මතුපිට අරුත ඉක්මවා අභ්‍යන්තර අර්ථය වටහාගෙන රඟපෑම යි.
(3) නළුවා අතිශෝක්තියෙන් යුතු ව අධිතාත්ත්වික ව රඟපෑම යි.
(4) නළුවා අන් අයකු ගේ චරිතයක් ගෙනහැර දක්වන්නකු ලෙස රඟපෑම යි.
(5) නාට්‍යකරුවා ගේ හැඟීම් හා මනෝගතීන් ප්‍රේක්ෂකයාට උද්දීපනයක් වන අයුරින් රඟපෑම යි. (.........)

**32.** නූතන අධ්‍යක්ෂකවරයා ගේ කාර්යය ප්‍රථම වරට ඉටු කළ සැක්සෙමෙයිනිංගන් කුමන ජාතිකයෙක් ද?
(1) ප්‍රංශ (2) ජර්මානු (3) ඉංග්‍රීසි (4) ඇමෙරිකානු (5) ඉතාලි (.........)

**33.** "ප්‍රේක්ෂාව යනු වේදිකාවේ දෘෂ්ටිගෝචරභාවය" යනුවෙන් නිර්වචනය කළේ කවරෙක් ද?
(1) ඇරිස්ටෝටල් (2) ප්ලේටෝ (3) ශේක්ස්පියර්
(4) ඉබ්සන් (5) ෂිලර් (.........)

**34.** නාට්‍යයක් වේදිකාගත කිරීමේ දී රංගභූමිය හා නිෂ්පාදනය සම්බන්ධ සෑම වගකීමක්ම දැරිය යුත්තේ කවරෙක් ද?
(1) නිෂ්පාදක (2) අධ්‍යක්ෂ (3) වේදිකා කළමනාකරු
(4) රංගවින්‍යාස ශිල්පියා (5) වේදිකා සහායකයෝ (.........)

**35.** නාට්‍ය කලාවේ භූමිකා යන පාරිභාෂික පදයට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) එක් චරිතයක් භූමිකා කිහිපයක් රඟපෑමෙන් නාට්‍යය අසාර්ථක වේ.
(2) චරිතයක් නිර්මාණයවීමට භූමිකා මගින් අනුබලයක් නොලැබේ.
(3) ඊඩිපස් නාට්‍යයේ ජොකස්ටා ගේ චරිතයට ඇත්තේ එක් භූමිකාවකි.
(4) රූකඩ ගෙදර නාට්‍යයේ නෝරාගේ චරිතයට දුෂ්කර භූමිකා කිහිපයක් ඇත.
(5) ජූලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස්, ස්වාමි පුරුෂයා ගේ භූමිකාවට ප්‍රමුඛතාව ලබා දේ. (.........)

**36.** ලෝකධර්මී නාට්‍යයක පසුතල නිර්මාණය කෙරෙනුයේ,
(1) සංකේතාත්මක උපකරණ මගින් ය. (2) චිත්තරූප හෝ සංකල්ප රූප මගින් ය.
(3) චිත්‍ර වස්ත්‍ර උපයෝගී කරගැනීමෙන් ය. (4) කාව්‍යමය භාෂාව උපයෝගී කරගැනීමෙන් ය. (.........)
(5) ද්‍රව්‍යමය වශයෙන් ත්‍රිමාණ ආකාරයෙන් ය.

**37.** නාට්‍ය සංගීතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) නාට්‍ය සංගීතය වාචික අභිනයට අයත් වේ.
(2) ශබ්ද සංකලනය නාට්‍ය සංගීතයේ ම කොටසකි.
(3) සංගීතය නාට්‍යයක ප්‍රේක්ෂාවේ අංගයකි.
(4) පටිගත කළ සංගීතය භාවිතය නූතන වේදිකාවෙන් බැහැර වී ඇත. (.........)
(5) ලෝකධර්මී නාට්‍යවල සංගීතය නො යොදාගැනේ.

**38.** නාට්‍ය විචාරයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය විචාරය පිළිබඳ පැරණිතම කෘතිය හමුවන්නේ ග්‍රීසියෙනි.
(2) පෙරදිග විචාර සිද්ධාන්ත අපරදිගට අදාළ නො වේ.
(3) නාට්‍ය විචාරකයකුට හොඳ ප්‍රේක්ෂකයකු විය නොහැක.
(4) විවෘත මනසකින් යුතු ව කරන විචාරය පක්ෂග්‍රාහී විය හැක. (.........)
(5) නාට්‍ය විචාරය හා ප්‍රේක්ෂක රස වින්දනය අතර සබඳතාවක් නැත.

**39.** ළමා නාට්‍ය කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) ළමා නාට්‍ය යනු ළමුන් විසින් ළමුන් උදෙසා නිර්මාණය කරන්නකි.
(2) ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය උදෙසා රාජ්‍ය සම්මාන උළෙලක් පැවැත්වේ.
(3) ළමුන් සඳහා ලෝක ධර්මී ගණයේ නාට්‍ය නිර්මාණ උචිත නො වේ.
(4) වැඩිහිටියන් ළමා නාට්‍ය නිෂ්පාදනය කිරීමේ සම්ප්‍රදායක් නැත. (.........)
(5) විවිධ වයස් කාණ්ඩවලට අදාළ ව ළමා නාට්‍ය නිෂ්පාදනය කිරීම අසාර්ථක ය.

**40.** කෙටි නාට්‍යයට අදාළ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) කාලයේ හා ස්ථානයේ ඒකත්වය මීට අදාළ නො වේ.
(2) අංක සහ ජවනිකා සීමා කිරීම අවශ්‍ය නො වේ.
(3) ඇන්ටන් චෙකොව් කෙටි නාට්‍ය රචනා කොට ඇත.
(4) කෙටි නාට්‍යයක ප්‍රබල විය යුත්තේ ආනුෂංගික අංග ය. (.........)
(5) දිගු නාට්‍යයක මෙන් ප්‍රධාන චරිතයක් සිටීම අවශ්‍ය නැත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

| විෂය අංකය<br>பாட இலக்கம் | 57 -II | විෂයය<br>பாடம் | නාට්‍ය හා රංග කලාව II |
|---|---|---|---|

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I කොටස/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 2 | 31. | 3 |
| 02. | 4 | 12. | 4 | 22. | 4 | 32. | 2 |
| 03. | 1 | 13. | 1 | 23. | 1 | 33. | 1 |
| 04. | 5 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 05. | 4 | 15. | 3 | 25. | 3 | 35. | 4 |
| 06. | 2 | 16. | 5 | 26. | 5 | 36. | 5 |
| 07. | 2 | 17. | 2 | 27. | 4 | 37. | 2 |
| 08. | 1 | 18. | 1 | 28. | 2 | 38. | 1 |
| 09. | 3 | 19. | 3 | 29. | 3 | 39. | 2 |
| 10. | 1 | 20. | 5 | 30. | 3 | 40. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

# II පත්‍රය

## A - කොටස

1. (i) ඊඩිපස් රජ නාට්‍යයේ ඊඩිපස් චරිතයේ දුර්වල ගුණාංග දෙකක් පෙන්වාදෙන්න. (ලකුණු 02 යි.)

- ක්ෂණික කෝපය
- තම මතයේ ම දැඩි ලෙස එල්බගෙන සිටීම
- අධිමානය

**(කරුණු 2 ක් සඳහන් කර ඇත්නම් ලකුණු 02යි.)**

(ii) ඊඩිපස් රජ නාට්‍යයේ සිවුවන අංකයේ එන පණිවුඩකරු ගේ පැමිණීම ඊඩිපස් ගේ ඉරණමේ තීරණාත්මක අවස්ථාවක් ලෙස සැලකිය හැකි ද? හේතු දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

ඊඩිපස් රජු ගේ භාග්‍ය පරිවර්තනය ඇරඹෙන්නේ හතර වන අංකයේ කොරින්තියානු පණිවිඩකරුවගේ පැමිණීම නිසාය. ඔහු ගේ පැමිණීම නිසා මෙතෙක් කිසිවකු නොදැන සිටි ඊඩිපස් ගේ උපත පිළිබඳ ව තොරතුරු අනාවරණය වේ. පියා මරා මව විවාහ කරගත් බව දැනගන්නේ මෙම පණිවිඩකරුවා නිසා ය. එය ඊඩිපස්ගේ ඉරණමේ තීරණාත්මක අවස්ථාව මෙන් ම යොකොස්ටගේ ඉරණම ද වෙනස් කරයි.

එම නිසා පණිවිඩකරු මගින් ඊඩිපස් රජු ගේ උපත පිළිබඳව හෙළිදරව් නොවුණේ නම් ඊඩිපස් ද යොකොස්ටා ද මෙවැනි ඉරණමකට මුහුණ පාන්නේ නැත.

**(තර්කානුකූල ලෙස සාකච්ඡා කර ඇත්නම් ලකුණු 06යි)**

(iii) සොෆොක්ලීස් ඊඩිපස් රජ නාට්‍ය පෙළින් මතුකොට දක්වන පරිදි ඊඩිපස් ගේ ඛේදජනක ඉරණමට වගකිව යුත්තේ කවරෙක් ද? සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

ඇපොලෝ දෙවි

ලායියුස් සහ ඔහුගේ බිසව වූ යොකොස්ටාට පුත් කුමරෙක් ඉපදුණි. ඔහු ඉපදෙන්නටත් පෙර සිටම ඔහු පිළිබඳ ව අභාග්‍ය සම්පන්න පෙර නිමිත්තක් ඩෙල්ෆි දෙව් මැඳුරෙන් ඇපොලෝ ගේ දේව වාක්‍යයක් ලෙස ප්‍රකාශ වී තිබුණි. එනම් මෙම දරුවා තරුණ වයසට පත් වූ විට පියා මරා මව විවාහ කරගන්නා බව ය. ඇපොලෝ දෙවියන් ගෙන් ප්‍රකාශ වූ මෙම භයානක පෙර නිමිත්ත ඉටු නොවන ආකාරයට ලායියුස් සහ යොකොස්ටා කටයුතු කිරීමට පෙළඹුණි. ඒ අනුව ඊඩිපස් රජුගේ ඛේදජනක ඉරණමට මූලික වශයෙන් ම වගකිව යුත්තේ ඇපොලෝ දෙවියා ය.

යන ආකාරයට පිළිතුරු ලියා තිබීම නිවැරදි වේ.

එහෙත් සිසුන් පහත පරිදි ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

ලායියුස්, යොකොස්ටා, ඊඩිපස් යන අය ගේ ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු විය. ඩෙල්ෆි දෙව් මැඳුරෙන් ප්‍රකාශ වූ දේව වාක්‍යයට අනුව ලායියුස් හා යොකොස්ටා පළමු ව ක්‍රියාත්මක වීම ඊඩිපස් රජු ගේ ඛේදජනක ඉරණමට අදාළ මූලික ම සිදුවීම වේ. දෙවනුව ඊඩිපස් ද එම දේව වාක්‍ය දැනගැනීම නිසා එයින් ගැලවීමට ක්‍රියාකිරීමට උත්සාහ ගැනීම ඛේදජනක ඉරණමකට මුහුණ පෑමට සිදු වූ හේතුව

යි. මෙම දේව වාක්‍යයට අනුව ක්‍රියාත්මක වීමට ඔවුන් කටයුතු නොකළේ නම් ඊඩිපස් රජ මෙවැනි ඛේදජනක ඉරණමකට මුහුණ පාන්නේ නැත.

**(නිවැරදි කරුණු සාකච්ඡා කර ඇති විට ලකුණු 07යි)**

(i) ජූලියස් සීසර් නාට්‍යයේ නාට්‍යමය අවස්ථා තීව්‍ර කරන පෙර නිමිති සහ සිහින අන්තර්ගත අවස්ථා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

- මාර්තු 15 වන දාට ප්‍රවේශම් වෙන්න ලෙස පේන කියන්නාගේ ප්‍රකාශය
- කැල්ෆර්නියාගේ සිහිනය (මුරකරුවකු දුටුවේයැ යි කැල්ෆර්නියා සඳහන් කරන අස්වාභාවික සිදුවීම්) දෙවන අංකය දෙවන දර්ශනය
- පළමු අංකයේ තුන්වන දර්ශනයේ දී සිසරෝ සහ කැස්කා හමු වූ විට ස්වභාවධර්මයේ අසාමාන්‍ය චර්යාවන් සහ අස්වාභාවික බලවේග සක්‍රිය වීම ගැන කියවෙන සංවාද මගින් ඉදිරියේ සිදුවීමට නියමිත භයානක සිදුවීම් ගැන පෙර නිමිති පෙන්වයි.

**(කරුණු 04 ක් සඳහන් කර ඇත්නම් ලකුණු 04යි)**

(ii) ඉන් එක් සිහිනයක් හෝ පෙර නිමිත්තක් අවස්ථා සම්බන්ධය සහිත ව පැහැදිලි කර එහි නාට්‍යමය අගය පෙන්වාදෙන්න. (ලකුණු 05 යි.)

අපේක්ෂකයා 2 i හි පිළිතුරට සැපයූ පෙර නිමිති අතරින් එකක් අවස්ථා සම්බන්ධය සහිත ව පැහැදිලි කර නාට්‍යමය අගය පෙන්වා දිය යුතු ය.

එහි නාට්‍යමය අගය,

- සීසර්ට මාර්තු 15 ප්‍රවේශම් වන්න, යන ලෙස කරන ප්‍රකාශය නාට්‍යය තුළ කුතුහලය ගොඩ නැගීමට හේතු වේ. මාර්තු 15 සීසර්ට කුමක් වේ ද යන හැඟීම ජනිත කරන අතර එම අංකය තුළම සීසර්ට විරුද්ධ ව කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වීමත් සමග එම ප්‍රකාශය මගින් ඇති කරනු ලැබූ කුතුහලය වර්ධනය කරයි. එය නාට්‍ය විකාශයට ඉතා වැදගත් වේ.
- කැල්ෆර්නියා ගේ සිහිනය සීසර් සෙනෙට් සභාවට යෑමට වූ සූදානම වළක්වනු ලබයි. මෙයින් ප්‍රේක්ෂකයා ඊට පෙර සීසර්ට විරුද්ධ ව ගොඩ නැගුණු කුමන්ත්‍රණය වැළකුණු බව සිතන අතර මොහොතකින් එම ස්ථානයට පැමිණෙන ඩෙසියස් එම සිහිනය, සීසර්ට ලැබීමට නියමිත ගෞරව නාම පිළිබඳ පෙර නිමිත්තක් යැ යි ප්‍රකාශ කර සීසර් කැපිටෝලයට රැගෙන යාමට ක්‍රියා කිරීමෙන් කුමන්ත්‍රණකරුවන් ගේ අරමුණු ඉටුවන ආකාරය පෙන්වයි.

iii) සිහින හා පෙර නිමිති පිළිබඳ ජූලියස් සීසර් ගේ ආකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

මාර්තු 15 වන දාට ප්‍රවේශම් වෙන්න, යන ප්‍රකාශය සීසර් නොසලකා හරියි. ඔහු සිහින දකින්නෙකු යයි පවසා සීසර් පිට ව යයි.

තුන්වන අංකයේ පළමු දර්ශනයේ දී කැපිටෝලයට එන සීසර් පේන කියන්නා දකින විට ඔහුගේ ප්‍රකාශය උපහාසයට ලක් කරමින් මෙවැනි අනාවැකි පිළිබඳ ව ඔහු කිසිවක් විශ්වාස නොකරන බව පෙන්වා දේ.

- කැල්ෆර්නියා ගේ සිහිනය සහ මුරකරුට දර්ශනය වූයේ යයි පැවසෙන දෑ පිළිබඳ ව වූ විශ්වාසයන් සීසර් බැහැර කරයි. සිහින මගින් සීසර් ගේ ජීවිතයට අනතුරක් සිදුවෙනවා ය යන කැල්ෆර්නියා ගේ අදහස ද සීසර් උපහාසයට ලක් කිරීම මගින් සීසර් මෙවැනි සිහින සහ පේන කියවීම් කිසිවක් විශ්වාස නොකරන අයකු බව තහවුරු වේ.

**පෙර නිමිති, සිහින පිළිබඳව සීසර් දරන ආකල්පය ඉහත ආකාරයට පැහැදිලි කර තිබීම සලකා බලා ලකුණු ලබා දෙන්න.**

***ලකුණු 06යි)***

**3.** (i) රූකඩ ගෙදර නාට්‍යයේ ප්‍රබලතම සංඥාර්ථ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)

- විසිතුරු ඇඳුම
- තරන්තලා නර්තනය
- නත්තල් ගස
- ගිනි උඳුන
- රූකඩ ගෙදර යන නාට්‍යයේ නම
- මැකරූන්

***(ලකුණු 03යි)***

(ii) ඔබ නම් කළ එක් සංඥාර්ථයක් හඳුන්වාදී, එය නාට්‍ය විකාශනයට කෙසේ බලපාන්නේ දැ යි පෙන්වාදෙන්න. (ලකුණු 06 යි.)

**i. තරන්තලා නැටුම**

නෝරා තරන්තලා නැටුම උපයෝගී කරගන්නේ නෝරා හෙල්ම ලිපිය ක්‍රොග්ස්ටඩ් ගේ ලියුම කියවීම ප්‍රමාද කරවීම සඳහා ය. එහිදී ඇය හෙල්ම තමා ළඟම රඳවාගැනීමටත් හෙල්ම ලියුම් පෙට්ටිය වෙත යාම වළක්වාගනිමින්, සිදුවීම් තවදුරටත් ඉදිරියට රැගෙන යාමට තරන්තලා නැටුම යොදා ගෙන ඇත. තරන්තලා නැටුම යනු රූකඩ ගෙදර නාට්‍යයේ කූට ප්‍රාප්තියයි. එම නර්තනයෙන් පසු ඇයගේ චිත්තාවේග සියල්ල පහ ව ගොස් ඕ ප්‍රකෘති තත්වයට පත් වේ.

**ii. විසිතුරු ඇඳුම**

තරන්තලා නැටුමට භාවිතා කරන විසිතුරු ඇඳුම නාට්‍ය විකාශනයේ දී භාවිතා කොට ඇත්තේ පහසුවෙන් සකසා නැවත පිළිසකර කළ නොහැකි සිය පවුල් ජීවිතය සහ අවසානයේ "මම ගැලවිලා නෝරා මම ගැලවිලා" යනුවෙන් හෙල්ම කරන ප්‍රකාශය යනුවෙන් ඇය විසිතුරු ඇඳුම ලිහා දමා සාමාන්‍ය ඇඳුමකට මාරු වන බව ප්‍රකාශ කිරීමෙන් ඇය මෙතෙක් බැඳී සිටි බැඳීම්වලින් මිදෙන බව සංඥා කරයි.

**iii. නත්තල් ගස**

නත්තල් ගස තුළින් නෝරා සහ හෙල්ම ගත කරන ආටෝපවත්, සාටෝපවත් වූ මධ්‍යම පාන්තික ව්‍යාජ පවුල් ජීවිතය පිළිබිඹු කරන අතර ක්‍රමයෙන් එය බිඳ වැටී යන අයුරු බාහිර ව සංකේතාත්මක ව පෙන්වීමේ සංඥාවක් ලෙස දැක්විය හැකි ය.

**iv. රූකඩ ගෙදර**

''රූකඩ ගෙදර'' සංඥාර්ථ කිහිපයක් දනවන නාමයකි. මෙහි කතා නායකයා සහ නායිකාව වන හෙල්ම සහ නෝරා එවක පැවති වික්ටෝරියානු හර පද්ධතියෙහි රූකඩ බවට පත් වී ඇත. ඔවුන්ට ඔවුන් ගේ අභිලාෂ පරිදි ක්‍රියා කිරීමෙහි නිදහසක් නැත. මන්ද ඔවුන් එම හර පද්ධතියේ වහලු න් බවට පත් වී සිටින බැවිනි. තව දුරටත් රූකඩයක් ලෙස ජීවත් වීමට සූදානම් නැති නෝරා සිය කුටුම්බය අතැර පිට වී යයි.

එසේ ම රූකඩ ගෙදරට ශක්තිමත් පදනමක් නැත. එහි තාවකාලික ඉක්මනින් සුණු විසුණු වී යන ස්වභාවය ද මින් සංඥාර්ථවත් කෙරේ.

**(ලකුණු 06යි)**

(iii) රූකඩ ගෙදර නාට්‍ය අවසානයේ හෙල්ම තුළ බලාපොරොත්තුවක් දනවන 'ආශ්චර්යය' කුමක් විය හැකි ද? ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06 යි.)

මෙහිදී නෝරා ''මම යන්නම් ටෝවල්ඩ්'' යනුවෙන් ප්‍රකාශ කර පිටව ගිය ද ඇය අනපේක්ෂිත ව නැවත ආපසු පැමිණේ යයි ඔහු තුළ ඇති බලාපොරොත්තුව ''ආශ්චර්ය'' ලෙස හැඳින්විය හැකිය.

**(අපේක්ෂිතයා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කර ඇති විට ලකුණු 06යි)**

**B කොටස**

4. (i) පල්ලියෙන් පිටත ජනවන්දනා නාට්‍ය රඟ දැක් වූ වේදිකා වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

i. බූත් (Booth Stage) Platform Stage
ii. බහු වේදිකා (Multiple Stage)
iii. මන්දිර වේදිකා (Mansion Stages)
iv. ජංගම රථ වේදිකා

**(4ක් නම් කර තිබේ නම් ලකුණු 02යි)**

(ii) චක්‍ර නාට්‍යවල ප්‍රේක්ෂාව ජනනය කිරීමට යොදාගත් රංගෝපක්‍රම **හතරක්** පෙන්වාදෙන්න. (ලකුණු 07 යි.)

i. බූත් වේදිකා මත විවිධ යන්ත්‍ර උපකරණ භාවිතය
උදා : සාතන් විසින් ක්‍රිස්තු තුමා දේව මාළිගාව මුදුනට ගෙන යනු ලැබීම සඳහා දොඹකර යොදා ගැනීම.

ii. සුර දූතයන් පියාපත් සහිත ව නිර්මාණශීලී ලෙස නිරූපණය කිරීම.

iii. යක්ෂයන් ගේ චරිත පෙන්වන විට උල් නියපොතු, දිගු හොට, අං, වල්ගා යොදා ගැනීම.

iv. ඇතැම් චරිත සඳහා වෙස් මුහුණු භාවිතය

v. වේදිකාව සකස් කර ඇති ආකාරය ද ප්‍රේක්ෂාව තීව්‍ර කිරීමට බලපා ඇත.
උදා : අපාය වම් පස, ස්වර්ගය දකුණු පස ඒ දෙක අතර (මැද) මෙලොව දර්ශනය වීම.

vi. වේදිකාව මත උමං දොරටු (Trap doors) තිබීම. මේ මගින් චරිත එක් වරම නොපෙනීයාම සහ පෙනී සිටීම නිසා ප්‍රේක්ෂාව තීව්‍ර කරයි.

vii. පසුතල හා රංග උපකරණ ආකර්ෂණීය ලෙස භාවිතා කිරීම.

උදා : නිරයේ මුඛ ද්වාරය (Hell mouth) පෙන්වීම සඳහා අලංකාරවත් ලෙස පසුතල සකසා තිබීම.

ශාන්ත ඇපලෝනියා ගේ දත් උගුල්ලාදැමීම සඳහා උල් ආයුධ සහ විශාල රූහැන් පටවල් භාවිතා කිරීම.

**(මෙවැනි රංගෝප ක්‍රම 4ක් පෙන්වා දී තිබීම සඳහා ලකුණු 04)**

(iii) එළිසබෙතීන යුගයේ නාට්‍යකරුවන් ජනවන්දනා නාට්‍යවලින් ලැබූ ආභාසය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

i. ජනවන්දනා නාට්‍යවල අනුගමනය කළ බහුවේදිකා ක්‍රමය අනුව ශේක්ස්පියර්ගේ නාට්‍යවල ද රංග අවකාශ කිහිපයකදී ම නාට්‍යයේ කාර්යය සිදුවීම.

ii. ග්ලෝබ් වේදිකාවේ රහස් උමං දොරටු තිබීම. එය මධ්‍ය කාලීන යුගයේ තිබූ වේදිකාවල ආභාසයකි.

iii. ශේක්ස්පියර් ගේ නාට්‍යවල එන්නා වූ අවතාර, රකුසියන් වැනි අමනුෂ්‍ය බලවේග ජනවන්දනා නාට්‍යවල ආභාසය නිසා බව කිව හැකිය.

iv. මොරලිටි නාට්‍යවලින් දිව්‍යමය මැදිහත්වීම බැහැර වී සාමාන්‍ය මිනිසුන්ගේ සදාචාරය කතා කලා මෙන් ශේක්ස්පියර්, ක්‍රිස්ටෝපර් මාලෝ වැන්නන් ගේ කතා වස්තුවලින් ද කරන්නේ මිනිසා කේන්ද්‍ර කරගත් කතා පුවත් විවරණය කිරීම යි.

v. මොරලිටි නාට්‍යයේ මෙන් ම ශේක්ස්පියර්ගේ චරිත ද තමා අවට සිටින්නන් සමඟ ද ස්වකීය චිත්ත අභ්‍යන්තරය සමග ගැටුම ප්‍රබල ලෙස විවරණය කිරීම.

vi. මධ්‍යකාලීන යුගයේ සකලජන වැනි නාට්‍යවල සාකච්ඡා කළ ධනය, බලය, කුසල්, අකුසල්, ඊර්ෂ්‍යාව වැනි මානුෂික හැඟීම් වඩාත් ප්‍රබලව වඩාත් සාධනීය ලෙස ශේක්ස්පියර් යොදාගැනීම.

vii. ජනවන්දනා නාට්‍යවල ප්‍රේක්ෂාව මැවීමට යෙදූ උපක්‍රම මෙන් ම ශේක්ස්පියර්ගේ නාට්‍යවල ද ප්‍රබල ප්‍රේක්ෂාවක් නිර්මාණය කරගැනීම, නාට්‍යෝපකරණ සහ ඇඳුම් පැළඳුම් යනාදිය යොදා ගැනීම ද පෙන්වාදිය හැකිය.

**(මෙසේ ලැබූ ආභාසය පැහැදිලි කර ලියා ඇත්නම් ලකුණු 06 යි)**

5. (i) විලියම් ශේක්ස්පියර් ගේ ඛේදාත්ම නාට්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

- රෝමියෝ ජුලියට්
- ජුලියස් සීසර්
- හැම්ලට්
- ඇන්ටනි හා ක්ලියෝපැට්රා
- කොරියෝලේනස්
- ට්‍රොයිලස් හා ක්‍රෙසීඩා
- ටිමොන් ඔෆ් ඇතැන්ස්

- මැක්බත්
- කිං ලියර්
- ඔතෙලෝ

එක් නාට්‍යයකට එක් ලකුණ බැගින් ලකුණු 4

(ලකුණු 04යි)

(ii) ඔහුගේ ඛේදාත්ම නාට්‍යවලට ආවේණික පොදු ලක්ෂණ තුනක් හඳුන්වා ඒ ගැන විමසීමක් කරන්න.

(ලකුණු 06 යි.)

- ශේක්ස්පියර් තම නාට්‍ය සඳහා අනුභූතිය සකස් කරගෙන ඇත්තේ ඓතිහාසික කතා, වංශ කතා, පුරාණෝක්ති, ජනප්‍රවාද වැනි මූලාශ්‍රය පදනම් කරගෙන ය.

- නාට්‍ය පිටපත අංකවලට හා දර්ශනවලට බෙදා තිබීම.
  ඔහුගේ සෑම නාට්‍යයක් ම අංකවලට බෙදා ඇත. එම අංක දර්ශනවලට ද බෙදා ඇත.

- වේදිකා පසුතලයක් භාවිතා නොකිරීම ද පොදු ලක්ෂණයකි.
  එලිසබතීන යුගයේ වේදිකා පසුතල භාවිතා නොවූ අතර නළුවන්ගේ ඇඳුම් පැළඳුම් හා වේදිකා උපකරණ මාර්ගයෙන් පෙන්නුම් කරන ලදි. නිදසුන් ලෙසින් රජ මාලිගයක් නම් නළුවන් ගේ ඇඳුම් පැළඳුම්, හිස පැළඳි ඔටුන්න, සිංහාසනය ආදියෙනි. විවිධ රංග අවකාශ ද භාවිතා කිරීම තවත් ලක්ෂණයකි. පෙර රංග භූමිය, ඇතුළු රංග භූමිය වශයෙන් භාවිත කළේ ය. මේ හේතුවෙන් පසුතල නිර්මාණ අනවශ්‍ය විය.

- සමාජයේ සෑම චරිතයක් ම අන්තර්ගත වන සේ චරිත නිර්මාණය කර තිබීම
  උදාහරණ ලෙස ජූලියස් සීසර් නාට්‍යයේ සපත්තු මහන්නා, පේන කියන්නා, සෙබළුන්, කවිකාර සින්නා ආදි පොදු මහජනයා නියෝජනය කරන චරිත .

- නිදහස් පද්‍ය උපයෝගී කරගෙන තිබීම
  කිසියම් චරිතකට උච්චාරණය කිරීම පිණිස කාව්‍යමය ස්වරූපයක් සහිත සංවාද අන්තර්ගත වීම

- අද්භූත සිදුවීම් බහුල වීම
  මෙය ද ශේක්ස්පියර්ගේ නාට්‍ය කලාවේ පොදු ලක්ෂණයකි. බ්‍රූටස් සීසර් ගේ අවතාරය දැකීම. හැම්ලට් කුමරු පියාගේ අවතාරය දැකීම නිදසුන් වේ.

- ඛේදනීය වීර චරිත 1ක් හෝ 2ක් තෝරා ගැනීම.

- ප්‍රභූ සමාජයේ චරිත ප්‍රධාන චරිතය වීම හා ඔවුන් ගේ ඛේදනීය අවසානය

- සර්වකාලීන තේමා තිබීම

එක් පොදු ලක්ෂණයකට ලකුණු 2 බැගින් ලක්ෂණ 3ක් විග්‍රහ කිරීමට ලකුණු 6 යි.

(iii) ජූලියස් සීසර් කුමන නාට්‍ය ප්‍රභේදයකට අයත් වන්නේ දැ යි සඳහන් කොට, ඊට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි.)

- ඛේදාත්ම නාට්‍ය පිළිබඳව ඇරිස්ටෝටල්ගේ විග්‍රහයට අනුව විමර්ශනය කරන කල ජූලියස් සීසර් ඛේදාත්මයක් ලෙස හැඳින්විය හැකිය. මෙහි ඛේදනීය වීරයා බ්‍රූටස් ය. බ්‍රූටස් විසින් ඝාතනය කරනු ලබන සීසර් නාට්‍යයේ වීරයා වන අතර, ඔහු හා බ්‍රූටස් අතර පවත්නා බැඳීම ඓතිහාසික වශයෙන් ද සත්‍යයකි. ඇරිස්ටෝටල් පෙන්වාදෙන පරිදි අන්‍යෝන්‍ය වශයෙන් හිතවත් කමකින් යුත් පුද්ගලයන් අතරින් කෙනෙකු අනෙකාට හිංසාවක් කිරීම ඛේදාත්මයක ලක්ෂණයකි.

- ඛේදනීය වීරයා වන බ්‍රූටස් ප්‍රභුවරයෙකි. උත්තුංග චරිතයකින් හෙබියෙකි. ඛේදනීය වීරයාගේ භාග්‍ය පරිවර්තනය ආරම්භ වන්නේ සීසර් ඝාතනයෙන් පසු තුන්වන අංකයේ දෙවන දර්ශනයේ සිදුවන අවමඟුල් දේශනයෙන් අනතුරු ය.

- සීසර් ඝාතනයෙන් පසු ඇන්ටනී මරාදැමිය යුතු බව කැසියස් පවසද්දී ඊට එරෙහි වීම, ඇන්ටනීට අවමඟුල් දේශනය පවත්වන්නට ඉඩ දීම, කැසියස්ගේ විරෝධය නොතකා පිලිප්පි බලා පිටත් වීම ආදි කරුණු අනුව ඛේදනීය වීරයාගේ චරිත ලක්ෂණයක් වන ප්‍රමාද දෝෂයට අදාළ කරුණු අනාවරණය වේ.

- ස්වකීය පරිකල්පන ශක්තිය යොදා ඓතිහාසික කථාව අවස්ථෝචිත පරිදි ගොඩනගා තිබීම.

- ඛේදනීය වීරයා දිවි නසාගැනීම ශේක්ස්පියර් යුගයේ ඛේදාත්ම නාට්‍යවලට එක් වූ ලක්ෂණයකි.

**(නිවැරදි කරුණු ලියා ඇත්නම් ලකුණු 05යි)**

**6.** (i) නාට්‍යයක් රඟදැක්වීමේ දී රංගභූමිය ආලෝක කිරීම සඳහා භාවිත කරන විදුලි පහන් වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

- යොමු පහන
- ධාරාලෝක පහන
- ස්ට්‍රිප් පහන
- අල්ට්‍රා වයලට් පහන
- ස්ට්‍රෝබ් පහන

**(ලකුණු 04යි)**

(ii) රංගාලෝකය සහ වේෂභූෂණ අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

i. නාට්‍යයක රංගාලෝක ශිල්පියා හා වේෂ භූෂණ නිර්මාණ ශිල්පියා තම තමන්ගේ කාර්යයන් පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ.

ii. ආලෝකයේ වර්ණය සමග ඇඳුම්වල වර්ණය වෙනස්වීම පිළිබඳව අවබෝධයෙන් සිටිය යුතු වීම.

උදාහරණ :

| ඇඳුම්වල වර්ණය | ආලෝක වර්ණ | | | |
|---|---|---|---|---|
| | රතු | නිල් | කහ | කොළ |
| රතු | රතු | රතු දම් | රතු | තද දුඹුරු |
| නිල් | කළු | නිල් | කලු හෝ තද අළු | තද කොළ / මිශ්‍ර කලු |
| කහ | රතු | කලු | කහ | කොළ |
| කොළ | කලු | තද කලු | කොළ | කොළ |

iii. ද්‍රව්‍ය වර්ණවලදී මූලික වන්නේ නිල්, කහ, රතු ය. ආලොකයේ දී මූලික වර්ණ වන්නේ නිල්, රතු, කොළ ය. මේ අනුව කහපාට රංගවස්ත්‍රයකට රතු ආලෝකය පතිත වූ විට එම ඇඳුම රතු පැහැය ගනී. කහ ද්විතියික වර්ණයක් බැවිනි. මෙසේ ද්‍රව්‍ය වර්ණ හා ආලෝකයේ වර්ණවල අන්‍යෝන්‍ය සබඳතාව හොඳින් දැනසිටිය යුතු ය.

iv. සුදු වර්ණය වේදිකාවේ භාවිත වන විට පතිත වන ආලෝක වර්ණය නිසා ඇඳුමේ සුදු වර්ණය නැති වී යයි. එවිට අර්ථය වෙනස් විය හැකි ය.

v.වේදිකාවේ දිළිසෙන ඇඳුම් සහ පැළඳුම් භාවිත නොකළ යුතු ය. එවිට ආලෝකය පරාවර්ථනය විය හැකි බැවිනි.

vi. ගුරු තරුව වැනි නාට්‍යයක පාසල් සිසුන්ට සුදු වර්ණය වෙනුවට ලා අළු පැහැති වර්ණය භාවිතා කරන්නේ ආලෝකයේ ඇති වර්ණ පිළිබඳ ව මූල ධර්ම නිසා ය.

•

(iii) රංගාලෝක ශිල්පියා ගේ කාර්යභාරය නාට්‍යයක සාර්ථකත්වයට කරන බලපෑම සාකච්ඡා කොට දක්වන්න. (ලකුණු 06 යි.)

i. නාට්‍ය යනු සාමූහික කලාවක් බවත් ආනුෂංගික කලාවන් අතර රංගාලෝකය ප්‍රබල වන බව

ii. රංගාලෝකය මගින් නාට්‍යයේ සාර්ථකත්වයට පහත සඳහන් කරුණු ඔස්සේ සාකච්ඡා කර පැහැදිලි කර තිබිය යුතු ය.

- නාට්‍යෝචිත අවස්ථා තීව්‍ර කිරීමට
- වේදිකාවේ පර්යාවලෝකන ලක්‍ෂණය ඇති කිරීමට
- තත්වානුරූපී මායාව ඇති කරලීමට


Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

- අතීතාවර්ජනයකට යාමට
- සන්නිවේදන මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම
- නළු කාර්යය තීව්‍ර කිරීමට
- කාලය (හිමිදිරිය, හිරු බැස යන වේලාව, අඩ අඳුර) ඇඟවීමට
- අංක හෝ ජවනිකා ලෙස රංගය වෙන් කිරීමට
- වේදිකාවේ හිස් අවකාශය දුරු කරලීමට
- මනා ප්‍රේක්ෂාවක් ඇති කරලීමට

ඉහත සඳහන් පරිදි නාට්‍යයක සාර්ථකත්වයට රංගාලෝකය විශාල දායකත්වයක් දරයි. එම නිසා රංගාලෝක ශිල්පියා ගේ නිර්මාණශීලි දායකත්වය වේදිකා නාට්‍යයේ සාර්ථකත්වයට කරන බලපෑම ඉහත **කරුණු 3 ක් ඔස්සේ සාකච්ඡා කර තිබීම සඳහා ලකුණු 06යි.**

PAST PAPERS WIKI

(30) WWW.PastPapers.WiKi (30)


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න